## ජගත් ජේ එදිරිසිංහ ගේ පිනි නවකතාව පිළිබඳ විචාරයකි




# නියත මරණයක පෙර වේදනාව - පිනි



රසික සූරියආරච්චි

තණ පත් අග පිනි බිඳු යන උදාහරණය සැමවිටම පාහේ යෙදෙන්නේ ජීවිතයේ අනියත බව කියා පෑමටයි. ඒ අනියත බව අප කුඩා කල සිටම ඉතා හොඳින් අසා දැන සිටිමු.

එසේ වෙතත්, සාමාන්‍යයෙන් සිදුවෙතැයි අපේක්ෂිත ක්‍රමයට අනුව අප ශරීර මුලින් හැදී, වැඩී, පසුව වියපත් වී, ක්‍රම ක්‍රමයෙන් දිරා ගොස් තවදුරටත් ජීවත්වන්නට ක්‍රමයක් නැතිම වූ කල අවසන් හුස්ම හෙළා එක්කෝ භූමදානව නැතහොත් අළු වී මෙලොවින් නොපෙනී යනු වෙනුවට, නොසිතූ නොපැතූ අයුරින් අකාලයේ අවසන් වෙනු දකින සැම විටකම අපට ඇති වන්නේ දුකකි. කණගාටුවකි.

අප හොඳින් දන්නා හඳුනන අයෙකු ඒ ආකාරයට අකාලයේ මිය යෑම ඒ දුක, කණගාටුව තීව්‍ර කරවයි. කරුණු එසේ වූ කල, ඔබට හෝ මට ම එවැනි අකාල මරණයකට නුදුරු අනාගතයේ දී අනිවාර්යෙන්ම මුහුණ දෙන්නට සිදුවෙන බව දැන ගන්නට ලැබුනොත් ඇතිවන තත්වය කෙලෙස වේද? අප කවර චෛතසික පීඩනයකට පත්වේද? මරණ දන්ඩණයට නියමිතව සිරභාරයේ පසුවන්නෙකු නොව නිදහසේ ජීවත්වෙන්නට අයිතිය ඇති අයෙකු මෙවැනි තත්වයකට පත් වුණාහොත් ඔවුන් කෙසේ ක්‍රියාකරාවිද? ඔවුන් වටා සිටින නෑසියන්, මිතුරන් කෙලෙස මේ තත්වයට මුහුණ දිය යුතුද?

ඒ, ඕස්ට්‍රේලියාවේ අප අතර වෙසෙන පුවත්පත් කලාවේදියෙකු, කවියෙකු, ගීත රචකයෙකු සහ නවකතාකරුවෙකු වන ජගත් ජේ එදිරිසිංහ ගේ පස්වන මුද්‍රිත නවකතාව වන පිනි කියවද්දී මගේ සිතේ පැන නැගී පැති කිහිපයකින් යුතු ප්‍රශ්ණයයි. වසර 2012 දී දයාවංශ ජයකොඩි සමාගම විසින් පවත්වන්නට යෙදුණු අත්පිටපත් තරගයේ දී හොඳම නවකතාව ලෙස තේරුණු පිනි මුද්‍රණය වී ඇත්තේ 2013 වසරේ දී ය.

පිනි නවකතාවට ජගත් ජේ එදිරිසිංහ වස්තු බීජය කොට ගෙන ඇත්තේ ජීවිතාවසානයෙන් කෙලවර වනු මිසක වෙනත් අත්දුටු පිළියමක් නොමැති දරුණු පිලිකාවක් තමන්ට වැළඳී ඇති බව දැනගන්නා අමන්දා නම් තරුණ බිරිඳක ගේ ජීවිතය එතැන් සිට ගලා යන ආකාරයයි. තමන්ට හිමිව ඇති අනිවාර්ය අවසානයට මුහුණ දීම සඳහා ලක ලැහැස්ති වනු පිණිස තමන්ගේ සැමියාගෙන් පවා ශාරීරිකව වෙන්වන ඇය, මානසික පිළිසරණක් පතා චිත්‍ර ශිල්පය ඉගෙන ගන්නට වෑයම් කරන හැටිත්, ඒ උත්සාහයේ දී ඇයට හමුවන විශ්වජිත් නම් තරුණ අවිවාහක චිත්‍ර ශිල්පියා සමග ඇය අධ්‍යාත්මික ආදරකින් බැඳෙන ආකාරයත් පිටු 130 ක් පුරා දිවයන පිනි නවකතාව තුලින් ජගත් ජේ එදිරිසිංහ අපට පවසයි. පිනි නවකතාව අවසාන වෙන්නේ එක්තරා ආකාරයක සුභවාදී නැවතුමකින් වුවද, එය කිසිසේත්ම සුඛාන්තයක් නොවන බව පාඨකයාට වැටහෙනු ඇත.

පිනි යනු සන්නස මාසික පුවත් සඟරාව සඳහා ජගත් ජේ එදිරිසිංහ කොටස් වශයෙන් ලියා පලකළ නවකතාවකි. මේ නවකතාව රචනයේ මුල් භාගයේදී තවත් අප නමින් නොදන්නා ලේඛිකාවක ගේ සහය තමන්ට ලැබුණු බව ජගත් ජේ එදිරිසිංහ පිනි පෙරවදනේ ලා සඳහන් කරයි. විශේෂයෙන්ම මේ නවකතාවේ ප්‍රධාන චරිත ද්වය වන අමන්දා සහ විශ්වජිත්ව ප්‍රංශයට රැගෙන යාමට එකී නාඳුනන ලේඛිකාවගේ සහය ලැබී ඇති බව පෙනේ. මාසික පුවත් සඟරාවක නවකතාවක් කොටස් වශයෙන් පළ කෙරෙනුයේ එක්තරා දුරකට පාඨකයන් සඟරාව කෙරෙහි ඇද බැඳ තබා ගැනීමට බව නොරහසකි. මේ සඳහා ලේඛකයින් උපයෝගී කරගන්නා ඇතැම් විධික්‍රම සමහර විටෙක කතාවේ අන්තර්ගතයට හෝ ගලා යාමට බලපෑම් ඇති කරන්නට ද ඉඩ ඇත. විශ්වජිත් චිත්‍ර ශිල්පියාට සිතින් පෙම් කරන පිනි නවකතාවේ එන ශාමිලා නම් තරුණ ශිෂ්‍යාව ගේ චරිතය නවකතාව කෙරෙහි පාඨක ඇල්ම වැඩි කිරීම පිස ඇතුල් කරන ලද්දක් දැයි මට පිනි නවකතාව මුල්වර කියවීමේ දී සිතුණි. එසේ නමුදු ඒ චරිතය මගින් විශ්වජිත් ගේ චරිතයේ නිරාමිෂ ගුණය ඉස්මතුවෙන බව ද කිව යුතුයි.

පිනි නවකතාවේ අවසානයක් නොවන අවසානයේ දී, ලේඛකයා මරනාසන්න රෝගී අමන්දා ව පාරම්පරික වෙද ක්‍රමයක ප්‍රතිකාර සඳහා වෙද හාමුදුරුනමක් ලඟට යවන්නේ කුමන අදහසකින්දැයි මට නිරවුල්ව වටහා ගත නොහැකි විය. එය බලාපොරොත්තුවක් ජීවත් කරවීමක් ද, නැතිනම් අනිවාර්ය අවසානය වෙත කෙමෙන් පිවිසීමක් ද?

රෝගී අමන්දා සහ ඇගේ සැමියා නිමන්ත ගේ නවක විවාහය බිඳී යාමට ප්‍රධාන හේතුව ලෙස නවකතාවේ දැක්වෙන්නේ අමන්දා ගේ රෝගී තත්වයයි. මෙය කොතෙක් දුරට පිළිගත හැකි කරුණක් දැයි යන්න ප්‍රශ්ණයකි. සැබෑ බැඳීමකින් පසුවෙන විවාහක යුවලක් මෙවැනි අවස්ථාවකදී සිටියාටත් වඩා බැඳීමක් ඇති කරගන්නවා නොවේද? මේ දුරස්වීමට සැබෑ හේතුව අමන්දා සහ නිමන්ත අතර කලින් සිටම පැවති විරාගී දුරස්ත බවය යන්න ලේඛකයා විසින් සලකා බැලිය යුතුව තිබූ මානයක් යැයි මට සිතේ.
පිනි නවකතාවේ එන භාෂාව සුමට ය. වියරණාදී දොසින් තොර බව ද පෙනේ. කතාව ඉදිරිපත් කර ඇත්තේ පාඨක සිත ඇද බැඳ තබාගන්නා ආකාරයට ය. එය ජගත් ජේ එදිරිසිංහ ගේ නවකතාවල සලකුණයි.
ජගත් ජේ එදිරිසිංහ වැනි පළපුරුදු ලේඛකයෙකු විසින් ලියවෙන නවකතාවකින් අප වැනි පාඨකයින් අපේක්ෂා කරන්නේ හුදෙක් කතන්දරයක් දැන ගැනීම නොවේ. මේ බව හොඳින් දන්නා ඔහු පිනි නවකතාවේ එන චරිත හරහා ජීවිතය, මරණය, ආදරය වැනි සර්වසාධාරණ කාරණා පිළිබඳව විවිධ අදහස් පාඨකයා වෙත ඉදිරිපත් කිරීම අගේ කළ යුතු කරුණකි. මෙහි එන එවැනි ඇතැම් අදහස් අප අසා පුරුදු ඒවා වුවද, ජගත් ජේ එදිරිසිංහ ගේ වදන් හරහා ඒවා සැබෑ දාර්ශනිකත්වයක් ගන්නා බව කිව යුතුය.

පිනි නවකතාව නිර්මාණාත්මක කෘතියක් ලෙස මගේ සිත ගත්තේය. නමුත් නවකතාකරුවෙකු ලෙස ජගත් ජේ එදිරිසිංහ තමන්ගේ ප්‍රශස්ත නිර්මාණය තවමත් අප වෙත ඉදිරිපත් කර නොමැති බව මගේ අවංක අදහසයි.
ඒ ප්‍රශස්ත නිර්මාණය නුදුරේදී ම අපට කියවන්නට ලැබේවා කියාද, එයට දයාවංශ ජයකොඩි අත් පිටපත් තරගයේ මතු සම්මානයක් පමණක් නොව රාජ්‍ය සාහිත්‍ය සම්මානය ද හිමිවේවා කියා ද ප්‍රාර්ථනා කරමි.

PANDA FAMILY DAY CARE

* PANDA FAMILY DAY CARE



Call us on
9794 9001
Level 1, Shop 38,
Dandenong Hub,
15 -23 Langhorne Street,
Dandenong, VIC 3175

***Would you like to become an Educator?***
**It is a wonderful opportunity to become an employee of panda and work from your home while providing high Quality and Personal Care for the Children.**

***Panda Family Day Care Offers a Flexible Child Care Service to Suit the needs of Families***

- **Caring for the whole community**
- **A quality multicultural service**

- ***Government subsidies for eligible families ( Child Care Benefit – CCB & Child Care Rebate –CCR)***

Full time
Part time
Before and after school
Occasional care
Care for children with additional needs
Evening and overnight care
School Holiday Care
Weekend/ public holiday care
24 Hour care